කැස්බෑව මාකන්දන ප්‍රදේශයේ මෝස්තර ශිල්පියෙකු දිවි තොරකර ගැනීමෙන් මිය ගිය පුවත පුවත්පත් තුළ වාර්තා වී තිබූ ලෙසටම, හිරු ටීවී ප්‍රධාන පුවත් විකාශය තුළද මිනිත්තු 03. තත්පර 31 ක කාලයක් තුළ ආවරණය වී තිබිණි.

කෙසේ නමුත්, එහිදී උල්ලංඝනය වී තිබූ දිවි තොර කර ගැනීම් වාර්තාකරණය සම්බන්ධව මාධ්‍ය මාර්ගෝපදේශයන් ගණනාවක් වෙත අපගේ අවධානය යොමු විණි.

* දිවි තොරකර ගත් ආකාරය සඳහන් කරන අතරම, දිවි තොර කර ගත් ආකාරය විස්තරාත්මකව දක්වා ඇත.

* දිවි තොරකර ගැනීමට පෙර ලියූ බවට පැවසෙන සටහන් උපුටා දක්වන අතරම එය කියවීමද සිදු කරයි

* දිවි තොර කර ගැනීම සම්බන්ධයෙන් හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) ලෙසින් වාර්තා කර ඇත.

* සංවේදී අන්තර්ගතයන් අඩංගු බවට කලින් දැනුම් දීමක් කරන අතර, තරුණ අයවලුන් දිවි තොරකර ගැනීමට සාධක මොනවාද යන්න පිළිබඳව විශේෂඥ වෛද්‍ය රූමි රූබන්ගේ අදහස් දැක්වීමක් ද පුවත හා පළ කරයි. එසේ වුවත්, දිවි තොර කර ගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකුට සහාය ලබාගත හැකි හදිසි උපකාරක අංක කිසිවක් පුවත සමග පළ කිරීමට උත්සුක වී නොමැත.

එසේ බලන විට,

1) මෙම දිවි තොරකර ගැනීම සම්බන්ධ පුවත, කෙතරම් වගකීම් සහගතව ප්‍රේක්ෂකයා වෙත ඉදිරිපත් කර ඇතැයි ඔබ සිතන්නේ ද? දිවි තොර කර ගැනීම් වාර්තාකරණය සම්බන්ධ මාධ්‍ය මාර්ගෝපදේශයන්, ඩිජිටල් මාධ්‍ය සඳහාද අදාළ නොවන්නේ ද?

2) දිවි තොර කර ගැනීමක් සම්බන්ධ මෙවැනි වාර්තාකරණයක්, තවත් අනුකාරක දිවි තොර කර ගැනීම සඳහා මාර්ගය හෙළි පෙහෙළි නොකරන්නේ යැයි සහතික වීමට හිරු රූපවාහිනී නාලිකාවට හැකියාවක් තිබේද?

උපකාරක අංක පළ කරමු, ජීවිතයක් රැක ගනිමු!

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0707308308
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)